**කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව - 2019**
**--------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය මූල්‍ය තත්තව ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ පිරිවැය රු.26,321,295 ක්වූ මෝටර් රථ 04 ක් තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද එම රථයන්හි ඵලදායි ජීවිත කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3 ප්‍රකාරව සලකා බලා ප්‍රත්‍යාගණනය කර එහි සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කිරීමට කටයුතු කර නොතිබුණි. | ආයතනය සතු වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා කමිටුවක් පත් කර ඇති අතර එම කමිටු වාර්තාව ලද පසු මූල්‍ය ප්‍රකාශන ගැලපීම් කිරීමට සටහන් කර ගනිමි. | එම රථයන්හි ඵලදායි ජීවිත කාලය සලකා බලා ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව පවත්වාගෙන යන ගොඩනැගිල්ලට නව කොටසක් ඉදිකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණු රු.2,460,000ක අත්තිකාරම් මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ පෙන්වනු වෙනුවට ජංගම නොවන වත්කම් යටතේ නොනිමි වැඩ ලෙස පෙන්වා තිබුණි. | එකඟ වේ. නිවැරදි කිරීමට සටහන් කර ගනිමි. | වියදම් වල ස්වභාවය සලකා නිවැරදි ලෙස ගිණුම් තැබීමට කටයුතු කළයුතු වේ. |
| (ඇ) | අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වූ නිලධාරීන් වෙනුවෙන් ආයතනය ගෙවූ පාඨමාලා ගාස්තු සහ බැංකුව ඒ වෙනුවෙන් අයකළ බැංකු ගාස්තු හා කොමිස් මුදල් වල එකතුව වූ රු.473,770ක් සමාලෝචිත වර්ෂයේ වියදමට ගලපා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් පෙන්නුම් කෙරුණි. | එකඟ වේ. නිවැරදි කිරීමට සටහන් කර ගනිමි. | නිවැරදි ලෙස ගිණුම් තැබීමට කටයුතු කළයුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 595,779 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 26,420,268 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 25,824,489 ක පිරිහීමට මෙහෙයුම් වියදම් රු.85,428,844 කින් හෙවත් සියයට 133 කින් වැඩිවී තිබීම හේතුවී තිබුණි

## 3. මෙහෙයුම් සමාලෝචන

--------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් කාබනික කෘෂිකර්මාන්තය සඳහා අවධානය යොමු කිරීමේ වැදගත්කම හඳුනාගෙන එම ක්ෂෙත්‍රයන්හි පර්යේෂණ වැඩි කළ යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍ර 07ක් ශ්‍රී ලංකාවේ පවතින පර්යේෂණ ආයතන වෙත හඳුන්වාදී තිබුණද කාබනික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය, වර්තමානයේ වෙළඳපළේ පවතින කාබනික ආහාරවල ගුණාත්මක තත්ත්වය සම්බන්ධයෙන් පර්යේෂණ 2017 වර්ෂයේ සිටම සිදුකර නොතිබුණි. | කාබනික කෘෂිකර්මාන්තය පිළිබඳ ජාතික කමිටුව විසින්, කෘෂිකර්මාන්තයට සම්බන්ද සියලුම පර්යේෂණ ආයතන වලට ආරාධනා කර වැඩමුළුවක් පවත්වා, සහභාගී වූ පර්යේෂකයින් වෙත ප්‍රමුඛතා ප්‍රකාශනය හඳුන්වා දුනි. සියලුම ආයතන වල පුස්තකාල වෙත ප්‍රමුඛතා ප්‍රකාශනය නොමිළේ බෙදා දීමද සිදු කර ඇත.<br>කෘෂිකාර්මික ප්‍රතිපත්ති සභාව මගින් කළමනාකරණය නොකළ ද,<br>• දැනට අපනයන සංවර්ධන ආයතනය විසින් මෙම පර්යේෂණ සිදුකරයි.<br>• කාර්මික තාක්ෂණ ආයතනය මගින් සිදු කරයි<br>• ජාතික විශ්වවිද්‍යාල මගින් මේ පිළිබඳ ව්‍යාපෘති සිදු කර ඇත | පර්යේෂණ ආයතන 24ට අදාළව මෙම ප්‍රමුඛතා හඳුන්වා දෙනු ලබන බැවින් එම ආයතන මගින්ද මෙම පර්යේෂණ සිදුකිරීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | කෘෂිකාර්මික පර්යේෂණ ආයතනවල සිදුකරන ලද පර්යේෂණ සංඛ්‍යාව, පර්යේෂණ සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැලසීම, පර්යේෂක (Research officer ), විද්‍යාඥ( Scientist) හා අනෙකුත් කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු සහ ආයතන සතු භෞතික සම්පත් පිළිබඳවත් තොරතුරු සමාලෝචිත වර්ෂය දක්වා රැස්කර තිබුණද, 2016 වර්ෂයෙන් පසු දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම (Information for Agricultural Research Managers) හා 2010 වර්ෂයෙන් පසු එම තොරතුරු ඇතුළත් වාර්ෂිකව නිකුත් කළ යුතු ප්‍රකාශන නිකුත් කර නොතිබුණි. | 2018 දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා ආයතන 28 ක දත්ත රැස් කිරීම අවසන් කර ඇත. එම එකතු කරන ලද දත්ත පිරිපහදු කර එක් දත්ත පද්ධතියකට ගොනු කිරීම අවසන් අදියරේ පවතී. ගොනු කිරීම අවසන් කළ පසු පද්ධතියට ඇතුළත් කර, ජූලි මස අවසන් වන විට පද්ධතිය යාවත්කාලීන කරනු ලැබේ.<br>හැම විට ම පවත්නා වසර තුළ රැස් කරනු ලබන්නේ පසු ගිය වසරට අදාළ තොරතුරුය. ඒ අනුව 2020 වර්ෂයේ දී එකතු කරනු ලබන්නේ 2019 වසරට අදාළ තොරතුරුය. එම නිසා 2019 වසරට අදාළ තොරතුරු මේ වන විටත් රැස් කරමින් පවතී.<br>වැඩ සටහනේ ප්‍රධාන අරමුණ දත්ත රැස්කර, තොරතුරු පද්ධතිය කළමනාකරණය කිරීමය. ඊට අමතරව, තොරතුරු බෙදා හැරීම පහසු වනු සඳහා ප්‍රකාශන මුද්‍රණය කිරීම 2010 වසර දක්වා සිදු කෙරුණි. පද්ධතිය අන්තර්ජාලය ඔස්සේ ලබා ගැනීමට පහසුකම් සලසා ඇති | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව පද්ධතිය යාවත්කාලීන කිරීම හා ප්‍රකාශන නිකුත් කිරීමට කටයුතු කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | බැවින්, මුද්‍රණය කිරීමේ අවශ්‍යතාවයක් නොමැත. | |
| (ඇ) | බංගලාදේශ කෘෂිකාර්මික පර්යේෂණ සභාව, මැලේසියානු කෘෂිකාර්මික පර්යේෂණ සභාව සහ කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව අතර 2011 හා 2016 වර්ෂවලදී ඇතිකරගත් අවබෝධතා ගිවිසුම් අනුව කෘෂිකාර්මික ක්ෂෙත්‍රයේ උපදේශකයින් හා විද්‍යාඥයින් හුවමාරු කිරීම යටතේ කෙටිකාලීන විදේශ පුහුණුවීම් සඳහා නිලධාරීන් 10 ක් යොමුකිරීමට 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලසුමේ දක්වා තිබුණද එවැනි පුහුණුවීම් අවස්ථා හඳුනාගෙන නිලධාරීන් යොමුකිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | 2019 වසර සඳහා නියමිතව වූයේ බංගලාදේශ කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව මගින් නිර්දේශිත විද්‍යාඥයින් කණ්ඩායමක් සඳහා "කුළුබඩු වර්ග වැඩි දියුණු කිරීම හා කුළුබඩු නිෂ්පාදනය තාක්ෂණය" පිළිබඳව ශ්‍රී ලංකාවේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් කෙරෙන කෙටිකාලීන පුහුණු වැඩසටහනකි. මෙය බංගලාදේශ කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව සමග එකඟ වූ පරිදි 2019නොවැම්බර් මස දෙවන සතිය තුළ සිදු කිරීමට නියමිත වුවත් 2019වසරේ නොවැම්බර් මස 16වන දිනට ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණයට දින නියම වූයෙන් ඊට අදාළ නවාතැන් පහසුකම් හා වැඩමුළුව පිළිබඳව කටයුතු සිදුකරන නිලධාරීන් මැතිවරණ රාජකාරී කටයුතු සඳහා අනුයුක්ත වන බැවින් පුහුණු වැඩසටහන 2020 වසර සඳහා කල් දමන ලදි. | ක්‍රියාකාරී සැලසුම පරිදි පුහුණුවීම් අවස්ථා හඳුනාගෙන නිලධාරීන් යොමුකිරීමට කටයුතු කළයුතු වේ. |
| (ඇ) | විදේශ පශ්චාත් උපාධි සඳහා යොමුකිරීමේ වැඩසටහන යටතේ පුහුණුව ලබන පර්යේෂකයින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂෙත්‍රය දැනට මුහුණ දෙන හෝ ඉදිරියේදී මුහුණ දීමට සිදුවිය හැකි ගැටළු හා ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කරමින් තම පර්යේෂණ මාතෘකාව තෝරා ගත යුතු බව දක්වා තිබුණද ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා වැඩි දියුණු කලයුතුයැයි හඳුනාගෙන ඇති කෘෂිකාර්මික යාන්ත්‍රීකරණය හා කාබනික කෘෂිකාර්මික ක්ෂේත්‍රයන් පශ්චාත් උපාධිය සඳහා තෝරාගෙන තිබූ නිලධාරීන් සංඛ්‍යාව ඉතා පහල මට්ටමක පැවතුණි. එසේ වුවත් මෙම තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ආයතනය විසින් සැලසුම් සහගත ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විගණනයේ පෙන්වා ඇති ක්ෂේත්‍ර වලටතෝරා ගන්නා ලද ශිෂ්‍යත්වලාභීන් අඩු ප්‍රමාණයක් වී ඇත්තේ පහත දක්වා ඇති හේතු නිසා බැවිනි.<br>• පුහුණුවීම් සඳහා ආයතන වලින් හඳුනා ගන්නා ලද ක්ෂේත්‍ර<br>• ආයතන වලින් නිර්දේශ කර ඇති පර්යේෂකයින් සංඛ්‍යාව<br>• ආයතන සංග්‍රහයට අනුකූලව ශිෂ්‍යත්වලාභීන් තෝරා ගැනීමේ අවශ්‍යතාවය | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි එවැනි විශේෂිත ක්ෂේත්‍ර මොනවාද යන්න තීරණය කර, ඒ අනුව තම පර්යේෂණ මාතෘකාව තෝරාගත යුතු බවට ලිඛිතව දක්වා නිලධාරීන් යොමුකිරීමටත්, ක්‍රමවේදයේ පවතින ශක්තීන් දුර්වලතා හඳුනාගෙන සුදුසු ක්‍රියාමාර්ග වලට එළඹීමටත් කටයුතු කළ යුතුයි. |
| (ඉ) | 2019 වර්ෂයේදී කෘෂිකර්ම පර්යේෂණ ආයතන වලින් කැඳවනු ලැබූ පර්යේෂණ යෝජනා වලින් තෝරාගත් ව්‍යාපෘති 02ක් සහ පසුගිය වර්ෂවලින් ඉදිරියට ගෙන ආ ව්‍යාපෘති 4ක් ද ඇතුළුව ව්‍යාපෘති 06ක් සඳහා අරමුදල් සැපයීමට සැලසුම් කර තිබුණද, 2017 හා 2018 වර්ෂ වලදී ආරම්භ කර මෙතෙක් නිම නොවූ තේ පර්යේෂණ ආයතනයේ පර්යේෂණ 3කට හා | මේ සඳහා වඩාත් විස්තරාත්මක වාර්තා ලබා ගැනීම සඳහා එම ආයතන වලින් විමසා යවා ඇති අතර එම තොරතුරු විගණනයට කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | නව ව්‍යාපෘති ආරම්භ කිරීමටත් පවතින ව්‍යාපෘති නියමිත කාලයට නිම කිරීමටත් ව්‍යාපෘති ප්‍රගතිය භෞතිකව පරීක්ෂා කිරීමටත් සුදුසු පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ 1කට පමණක් සමාලෝචිත වර්ෂයේදී අරමුදල් සපයා තිබුණි. මෙම එක් එක් ව්‍යාපෘතියේ කාර්යසාධනය භෞතිකව පරීක්ෂා කිරීමට සභාවේ නිලධාරීන් කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළව නව යෝජනා හඳුනාගෙනද නොතිබුණි. | | |
| (ඊ) | දැනට පවතින පර්යේෂණ ආයතන 11 හි පර්යේෂණ නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් මල් වගාව, වන වගාව, කෘෂිකාර්මික යාන්ත්‍රීකරණය, ස්වභාවික සම්පත් කළමණාකරණය යන ක්ෂෙත්‍ර හතර පිළිබඳව සිදුකරන ලද පර්යේෂණ සංඛ්‍යාව 2017 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේදී 378කින් අඩුවී තිබුණි. | දක්වා ඇති ජාතික කමිටු වලට අයත් වන ආයතන වල දැනට සේවය කරන පර්යේෂණ නිලධාරීන් ගණන අඩු බැවින් හා එම අංශ වල අත්‍යාවශ්‍ය දෛනික සේවාවන් සඳහා ඉතිරි වී සිටින පර්යේෂණ නිලධාරීන්ගේ අවධානය වැඩිමනක් යොමු කිරීමට අවශ්‍ය බැවින් 2018 හා 2019 වසර වලසිදු කරන ලද පර්යේෂණ සංඛ්‍යාව 2017 වර්ෂයට සාපේක්ෂව අඩු ප්‍රමාණයක් විය. ඉදිරියේ දී පර්යේෂණ නිලධාරීන් බඳවා ගැනීම සමග මෙම තත්ත්වය මගහැරී යනු ඇත. තව ද මේ සඳහා ලබා දෙන ප්‍රතිපාදන සීමා වීම ද මෙයට බලපා ඇත. | පර්යේෂණ නිලධාරීන් බඳවා ගැනීමට හා ප්‍රතිපාදන වැඩි කිරීමට කටයුතු කර අදාළ පර්යේෂණ සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (උ) | කෘෂිකර්ම පර්යේෂණ කටයුතු සඳහා පර්යේෂණ ආයතන හතරකට හා විශ්ව විද්‍යාල දෙකකට ලබාදුන් මුදලින් ප්‍රතිපත්ති සභාව වෙත පියවිය යුතු රු.659,131 ක මුදල මෙතෙක් අයකර ගැනීමට කටයුතු නොකර 2006 වර්ෂයේ සිට ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පවතී. | එය නිවැරදි කිරීමට උත්සාහ දරා ඇති අතර ඉදිරියේ දී එය නිවැරදි කර මූල්‍ය ප්‍රකාශන වලට ගැලපීමට පියවර ගනිමි. | අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ඌ) | 2016 සිට 2018 දක්වා කාලය තුළ සේවා සැපයීම වෙනුවෙන් පෞද්ගලික ආයතන කිහිපයක් විසින් තැන්පත් කරන ලද රු.192,890 ක මුදලක් නිදහස් නොකර ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පවතී. | සාමාන්‍යයෙන් මෙම තැන්පතු මුදල් නිදහස් කරන්නේ අදාළ ආයතන විසින් ඉල්ලීමක් කළ පසුවය. නමුත් අදාළ ආයතන වලින් මෙතෙක් මුදල් ඉල්ලීමක් කර නොමැති හෙයින් මෙම ශේෂයන් දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු තැන්පත් ලෙස දක්වා ඇත. නමුත් ඉදිරියේ දී මෙම මුදල් නිරවුල් කිරීමට කටයුතු කරමි. | ලිඛිත දැනුම්දීමක් සිදු කර අදාළ මුදල් නිදහස් කිරීමට කටයුතු කළ යුතුයි. |

**3.1 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩල තනතුරු 36 තුළ වසර කිහිපයක සිට පවතින පුරප්පාඩු සඳහා සමාලෝචිත වර්ෂයේදීද බඳවා ගැනීමට කටයුතු නොකිරීම නිසා ආයතනයේ ප්‍රධාන තනතුරු 05ක් එනම් ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී , ගණකාධිකාරි, පරිපාලන නිලධාරී හා පුස්තකාලාධිපති යන තනතුරු පුරප්පාඩුව පැවතුණි. | අනුමැතිය ලබාගැනීමෙන් පසු අදාළ තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | බඳවා ගැනීමට අනුමැතිය කඩිනමින් ලබාගැනීමට කටයුතු කළයුතු වේ. |